# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1493/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 21/09/2024 පැය 0550

**මාධ්‍ය නිවේදනය**

## 01. දියේ ගිලී කුඩා දැරියක් මියයාමක් - දුන්ගාල්පිටිය පොලිස් වසම.

2024.09.20 වන දින උදෑසන කාලයේ දුන්ගාල්පිටිය පොලිස් වසමේ කැපුන්ගොඩ ප්‍රදේශයේ කුඩා දැරියක් මුහුදේ ගසාගෙන ගොස් ඇති බවට 119 තොරතුරු මධ්‍යස්ථානයෙන් දුන්ගාල්පිටිය පොලිසියට ලද පණිවිඩයක් මත විමර්ශනයක් ආරම්භ කර ඇත. පොලිස් නිලධාරීන් සහ ප්‍රදේශවාසීන් එක්ව සොයා බැලීමේදී දැරියගේ මෘත ශරීරය සිද්ධිය වූ ස්ථානය ආසන්නයේදී හමුවී ඇත.

**මියගිය දැරිය වයස අවුරුදු 01 මාස 10 ක් වන කැප්නුගොඩ, පමුණුගම ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මියගිය දැරියගේ නිවස මුහුදු වෙරළ ආසන්නයේ පිහිටා ඇති අතර, දැරිය ඇයගේ වයස අවුරුදු 06 ක සහෝදරයා සහ මිත්තණිය සමඟ නිවසේ සිට ඇත. මව සහ පියා රැකියාව සඳහා ගොස් සිටියදී මෙම අනතුර සිදුව ඇති අතර, දැරිය තනිවම මුහුදු වෙරළට ගොස් මෙම අනතුරට ලක්ව ඇති බවට පොලිසිය කළ විමර්ශණයේදී අනාවරණය වී ඇත. මෘත ශරීරය හදිසි මරණ පරීක්ෂණය සිදුකර මීගමුව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. දුන්ගාල්පිටිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 02. හදිසි ගින්නක් - කාත්තන්කුඩි පොලිස් වසම.

2024.09.20 වන දින රාත්‍රී කාලයේ කාත්තන්කුඩි පොලිස් වසමේ උප්පෝඩෙ ප්‍රදේශයේ පිහිටි කෝවිලක හදිසි ගින්නක් හට ගෙන ඇති බවට කාත්තන්කුඩි පොලිසියට ලද පණිවිඩයක් මත වහාම ක්‍රියාත්මක වූ පොලිස් නිලධාරීන්, මඩකලපුව නගර සභා ගිනි නිවන ඒකකයේ නිලධාරීන් කැඳවා ගින්න මැඩ පවත්වා ඇත.

මෙම කෝවිල පොල්අතු සෙවිලි කර තාවකාලික ගොඩනැගිල්ලක් ලෙස සක්ස කර තිබී ඇත. ගින්න ඇතිවන අවස්ථාවේදී කෝවිලේ පූජා පවත්වමින් සිට ඇති අතර, ගින්න හේතුවෙන් බැතිමතුන්ට කිසිවෙකුටත් හානි සිදුව නොමැත. ගින්න

ඇති වීමට හේතුව මෙතෙක් අනාවරණය වී නොමැත. කාත්තන්කුඩි පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - උඩවලව පොලිස් ස්ථානය.**

2024.09.20 වන දින රාත්‍රී කාලයේ උඩවලව පොලිස් වසමේ මහආර ප්‍රදේශයේදී උඩවලව පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 25 ක් වන උඩවලව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

උඩවලව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**04. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා අළුත්ගම කඳවුර.**

2024.09.20 වන දින අළුයම් කාලයේදී වැලිපැන්න පොලිස් වසමේ වලගෙදර ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා අළුත්ගම කඳවුරේ නිලධාරීන් විසින් වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 06 මිලිග්‍රෑම් 420 ක් සහ මුදල් රුපියල් 240,000/- ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන වැලිපැන්න පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 40 ක් වන වලගෙදර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

වැලිපැන්න පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**05. තේක්ක දැව කඳන් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා අරන්තලාව කඳවුර.**

2024.09.20 වන දින උදෑසන කාලයේදී මහඔය පොලිස් වසමේ පලතුරුවැල්ල ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා අරන්තලාව කඳවුරේ නිලධාරීන් විසින් වැටලීමක් සිදුකර බලපත්‍ර නොමැතිව **තේක්ක දැව කඳන් 10 ක්** සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන සේරංකඩ බීට්ටු වන කාර්යාලය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 28 ක් වන සේරන්කඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**